මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

**මාධ්‍ය නිවේදන අංක :PRE/2024/12** **2024.08.05**

## ජනාධිපතිවරණය - 2024.09.21

2024.09.21 දින පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණයේ දී ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි ඡන්ද හිමියන්ට දිවයිනේ ඕනෑම ඡන්ද පොළකින් ඡන්දය ප්‍රකාශ කිරීමට පහසුකම් සලසා ඇතැයි යනුවෙන් මැතිවරණ කොමිෂන් සභාවේ කිසිදු නිල තීරණයක් නොවන සම්පූර්ණ අසත්‍ය කරුණු ඇතුළත් සාවද්‍ය ප්‍රවෘත්තියක් මාධ්‍ය හා සමාජ මාධ්‍ය තුළ සංසරණය වෙමින් පවතී.

මැතිවරණ නීති රීති අනුව ඡන්ද විමසීම්වල දී ඡන්දය ප්‍රකාශ කළ හැකි වන්නේ, තමා ඡන්ද හිමියකු වශයෙන් ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වී ඇති ඡන්ද කොට්ඨාශයට අයත් ඡන්ද මධ්‍යස්ථානය වෙත පැමිණීමෙන් හා තැපැල් ඡන්ද හිමිකම ඇති අයෙකුට තමාගේ සහතික කිරීමේ නිලධාරියාගේ කාර්යාලයේ දී ඔහු ඉදිරියේ සිය ඡන්දය ප්‍රකාශ කිරීමෙනි.

2024 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි ඡන්ද හිමියන්ගේ ලිපිනය වෙත ඡන්දහිමියාගේ නම, ඡන්දය ප්‍රකාශ කළ හැකි ඡන්ද මධ්‍යස්ථානය, ඡන්ද විමසීම පැවැත්වෙන දිනය හා වේලාව ද සඳහන් කොට නිල ඡන්ද දැන්වීම්පතක් තැපැලෙන් ලැබෙනු ඇත. එහි සඳහන් ඡන්ද පොළට පරිබාහිර ඡන්ද පොළක දී ඡන්දය ප්‍රකාශ කිරීමට කිසිවකුටත් අවකාශ නොමැත.

එබැවින් මැතිවරණ කොමිෂන් සභාවේ නිල නිවේදන නොවන සාවද්‍ය ප්‍රවෘත්ති පළ කිරීමෙන් වළකින ලෙස සියළුම මාධ්‍ය වෙත දන්වා සිටින අතර එවැනි සාවද්‍ය ප්‍රවෘත්තිවලට නොරැවටී තමා වෙත ලැබෙන නිල ඡන්ද දැන්වීම්පතෙහි සඳහන් ඡන්ද මධ්‍යස්ථානයට ගොස් ඡන්දය ප්‍රකාශ කරන ලෙස මැතිවරණ කොමිෂන් සභාව සියළුම ඡන්ද හිමියන්ගෙන් ඉල්ලා සිටී.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

(+94)112868441-42-43 (+94)112868426 info@elections.gov.lk www.elections.gov.lk Election Commission of Sri Lanka SriLankaElectionCommission elecomsl